

# ඔයයි මමයි

සෙනුලි රශ්විතා මෙනන්

## ඔයයි මමයි

සෙනුලි රශ්විතා මෙනන්

## වෙනත් කෘතීන්

- අපේ සීයා තාත්තා සුරංගනා ලෝකයට ගිය හැටි
- සමනල කඩය
- බිය වුන පූස් රාළ

2023 නොවැම්බර් 15

ISBN 978-624-206-596-0

# පිදුම

මට හැමදාම ආදරය කරන
අම්මා, තාත්තා, නංගී ඇතුළු පවුලේ සියලු
දෙනාටත්,
මගේ සියලුම යහළුවන්ටත්
මට අකුරු කියවූ චන්ද්‍රලතා ගුරු මෑණියන්ටත්,
චම්පිකා ගුරු මෑණියන්ටත්, නිල්මිණි ගුරු මෑණියන්
ඇතුළු මට සිප් කිරි පෙවූ සියලු ගුරු මෑණිවරුන්
සහ පියවරුන්ටත්,
ග්‍රන්ථකරණය සඳහා නිරන්තරයෙන් අප
දිරිමත් කරන සෙනෙවිරත්න ගුරු පියාණන්ට සහ
අපගේ විදුහල්පතිතුමියටත්
මාගේ මේ කෘතිය  බැති සිතින් පුදමි.

# පෙරවදන

වර්තමන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන, ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි .

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් “දිවිය දිනන විද්‍යුත් පොතක් “ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ “දිවිය දිනන විද්‍යුත් පොතක් “ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

**ශෂිකලා සේනාධීර**
විදුහල්පතිනිය,
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023.11.01




②

පුංචි බබෙක් ඉපදුනේ
පොඩි පැළයක් සිටෙව්වේ
පුංචි බබයි ඒ පැළයයි
දෙන්නම හරි පොඩිනේ

පුංචි බබා ලොකු වෙන්නේ
ඒ පැළයත් එක්කම නේ
පුංචි බබයි පොඩි පැළයයි
සිටියේ හරි සතුටෙන්නේ





පුංචි පැංචි ලොකු වෙන්නේ
පොඩි පැළයත් උස යන්නේ
මේ පැංචි හරි සතුටින්
පුංචි පැළය රැක ගන්නේ

පුංචි පැංචි ලොකුයිනේ
පොඩි පැළයත් ගසක්නේ
දෙන්න එක්ක එක්වෙලා
ලොකු ලොකු වැඩ කරන්නේ





එක දවසක් උදෙන්ම
දෙන්න එක්ක එක්වුනේ
අපිට කන්න පිට්ටු කියා
කෝම්පිට්ටු සෑදුවේ

නිල් අහසම කළු වුණෝ
මහ හයියෙන් ගෙරෙව්වේ
මොකක්ද මේ වෙන්න යන්නේ
අඹ යාළුවෝ බය උනේ



වැහිපොද ඇද හැලෙන්නේ
කෝම්පිට්ටු දිය උනේ
පුංචි පැංචි තෙමෙන්නේ
මොනවද දැන් කරන්නේ

මහ වැස්සක් වහින්නේ
පුංචි පැංචි අඬන්නේ
එන්න යාළු මගේ ළඟට
වීර ගසයි කියන්නේ





පුංචි පැංචි දුවන්නේ
ඇගේ යාළු ළඟටනේ
ඇගේ යාළුවගේ සෙවනින්
පුංචි පැංචි රැකෙන්නේ

වැස්ස සෙමෙන් අඩු වුණෝ
ඉර මාමත් හිනැහුනේ
අපේ පැංචි හරි සතුටින්
ගී ගයමින් නැටුවනේ

පුංචි පැළෙත් එක්කලා
හරි හරියට ලොකු වෙලා
පරිසරයම රැකගන්නා
පුංචි පැංචි මම තමා



# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්මින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු .

මෙයට

**සෙනෙවිරත්න මහලේකම්**

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ

ව්‍යාපෘතියේ නිර්මාපක

2023.11.01